ශ්‍රී ලංකා මහ බැංකුව

# සාර්ව ආර්ථික ප්‍රවණතා ප්‍රස්තාර ඇසුරින්

2025 සැප්තැම්බර් මස අවසානය වන විට
(2025.10.15 දින නිකුත් කරන ලදී)




*සටහන: මෙම කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කරන සාර්ව ආර්ථික ප්‍රවණතා ප්‍රස්ථාරවල යාවත්කාලීන බව සහතික කිරීම සඳහා, එම ප්‍රස්ථාර නිකුත් කරන දිනය වන විට අදාළ කාර්තුව සඳහා පවතින නවතම දත්ත ඇතුළත් වේ.*

# පෙළගැස්ම

## මූර්ත අංශය සහ උද්ධමනය

- මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
- ආංශික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
- ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
- කාර්මික නිෂ්පාදන දර්ශකය
- සේවා වියුක්තිය
- දිළිඳු ජනගහන ප්‍රතිශතය
- කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය
- ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය
- නිෂ්පාදකයන්ගේ මිල දර්ශකය

## විදේශීය අංශය

- වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම්
- වෙළඳ භාණ්ඩ ආනයන වියදම්
- වෙළඳ ශේෂය
- සංචාරක කර්මාන්තය
- විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ
- ජංගම ගිණුමේ ශේෂය
- විදේශීය ඍජු ආයෝජන ලැබීම්
- ගෙවුම් තුලනය
- දළ නිල සංචිත සහ ආනයනික මාස ගණන
- විනිමය අනුපාතිකයන්ගේ හැසිරීම

## රාජ්‍ය මූල්‍ය අංශය

- රාජ්‍ය ආදායම සහ ප්‍රදාන
- රාජ්‍ය වියදම
- රාජ්‍ය ආයෝජන
- අයවැය හිඟය
- මධ්‍යම රජයේ ණය

## මුදල් අංශය

- ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, නිත්‍ය පහසුකම් අනුපාතික සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය
- භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික සහ ඵලදා වක්‍රය
- වෙළඳපොළ පොලී අනුපාතික
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතික
- දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව
- සංචිත මුදල් වර්ධනය, මුදල් ගුණකය සහ මුදල් සංසරණ ප්‍රවේගය
- පුළුල් මුදල් වර්ධනය
- පෞද්ගලික අංශයට ලබා දුන් ණය
- පුළුල් මුදල් සැපයුම (M2b) [ද.දේ.නි.යේ % ලෙස]
- පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ දේශීය ණය [ද.දේ.නි.යේ % ලෙස]
- ප්‍රධාන අංශ අනුව පෞද්ගලික අංශයට ලබා දුන් ණය
- රජයට ලබා දුන් ශුද්ධ ණය
- රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය
- ශුද්ධ විදේශීය වත්කම්


## මූල්‍ය අංශය

- බැංකු අංශයේ වත්කම් සහ වගකීම්
- බැංකු අංශයේ 3වන අදියරෙහි ණය
- ලාභදායිතා දර්ශක
- ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත
- පළාත් අනුව බැංකු ඝනත්වය
- බැංකු නොවන මූල්‍ය අංශයේ දර්ශක (i)
- බැංකු නොවන මූල්‍ය අංශයේ දර්ශක (ii)
- කොටස් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය

# මූර්ත අංශය සහ උද්ධමනය

# මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය

## වාර්ෂික මූර්ත ද.දේ.නි.යේ වර්ධනය





## කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනය




සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වේ.
2025 සැප්තැම්බර් 15වන දින ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව දත්ත යාවත්කාලීන කර ඇත.

මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


# ආංශික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය - කෘෂිකර්මාන්ත




සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වේ.
2025 සැප්තැම්බර් 15වන දින ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව දත්ත යාවත්කාලීන කර ඇත..

මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


# ආංශික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය - කර්මාන්ත




සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වේ. 2025 සැප්තැම්බර් 15වන දින ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව දත්ත යාවත්කාලීන කර ඇත.

මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


# ආංශික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය - සේවා




සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වේ.
2025 සැප්තැම්බර් 15වන දින ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව දත්ත යාවත්කාලීන කර ඇත.

මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


# ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය




සටහන : 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතය භාවිතා කරමින් ගණනය කරන ලද නවතම කාර්තුමය දළ දේශීය නිෂ්පාදිතය ඇමරිකානු ඩොලර් වලින් ගණනය කෙරේ. ඇස්තමේන්තු නවතම ජනගහන සංඛ්‍යා සමඟ යාවත්කාලීන කර ඇත. එ.ජ.ඩොලර් තුළින් දළ දේශීය නිෂ්පාදිතය ව්‍යුත්පන්න කිරීම සඳහා වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතයට සාපේක්ෂව කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාත භාවිතයේ වෙනස්කම් හේතුවෙන් මෙම අගයන් ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත අගයන්ගෙන් වෙනස් විය හැකිය.

මූලාශ්‍ර: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


# කාර්මික නිෂ්පාදන දර්ශකය




සටහන: කාර්මික නිෂ්පාදන දර්ශකය (2015=100) මත පදනම් වී ඇත.


මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# සේවා වියුක්තිය




මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# දිළිඳු ජනගහන ප්‍රතිශතය





සටහන: 2019 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයෙහි දත්ත භාවිතයෙන් ගණනය කරන ලද නිල දරිද්‍රතා රේඛාව මත පදනම් වේ.


මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය

## කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය




## කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය*





*මූලික උද්ධමනය ගණනය කර ඇත්තේ නිතර මිල උච්චාවචන සහිත ආහාර, බලශක්ති සහ ප්‍රවාහන යන අයිතම කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන් ඉවත් කිරීමෙනි.

සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි මාසයේ සිට කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව, 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.


මූලාශ්‍රය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ උද්ධමනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය




## ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය*





*මූලික උද්ධමනය ගණනය කර ඇත්තේ නිතර මිල උච්චාවචන සහිත ආහාර, බලශක්ති සහ ප්‍රවාහන යන අයිතම ජාතික පාරිභෝගික මිල දර්ශකයෙන් ඉවත් කිරීමෙනි.

සටහන : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි මාසයේ සිට ජා.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# නිෂ්පාදකයන්ගේ මිල දර්ශකය*





*නිෂ්පාදකයන්ගේ මිල දර්ශකය (2018 සිව්වන කාර්තුව=100) මත පදනම්ව

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# විදේශීය අංශය

# වෙළඳ භාණ්ඩ අපනයන ඉපැයීම්

## වෙළඳ භාණ්ඩ අපනයන - වාර්ෂික





## වෙළඳ භාණ්ඩ අපනයන - මාසික




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු අධිකාරිය

# වෙළඳ භාණ්ඩ ආනයන වියදම්

## වෙළඳ භාණ්ඩ ආනයන - වාර්ෂික





## වෙළඳ භාණ්ඩ ආනයන - මාසික




මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගු අධිකාරිය


# වෙළඳ ශේෂය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# සංචාරක කර්මාන්තය


## සංචාරක පැමිණීම් සහ ඉපැයීම්




*(අ) 2025 අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාවේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කළ ද, සංචාරක ඉපැයීම්වල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2025 අගෝස්තු මාසයේ දී සෘණ වර්ධනයක් වාර්තා වූයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2025 අගෝස්තු මාසයේ දී සංචාරකයෙකු විසින් එක් දිනක් තුළ දරන වියදමෙහි සාමාන්‍යය සඳහා වන ඇස්තමේන්තුව අඩු කිරීම හේතුවෙනි.*


මූලාශ්‍ර : ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## මාසික සංචාරක පැමිණීම්




මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

# විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# ජංගම ගිණුමේ ශේෂය





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# විදේශීය සෘජු ආයෝජන ලැබීම්





මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව
ආයෝජන මණ්ඩලය
කොළඹ කොටස් හුවමාරුව

# ගෙවුම් තුලනය - සමස්ත ශේෂය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# දළ නිල සංචිත සහ ආනයනික මාස ගණන*





* භාවිත කිරීමේ හැකියාව පිළිබඳ කොන්දේසිවලට යටත්ව චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරුවෙන් ලද ලැබීම් 2021 වසර අවසානයේ සිට දළ නිල සංචිතවලට ඇතුළත් වේ.


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# විනිමය අනුපාතිකයන්ගේ හැසිරීම්


### එක්සත් ජනපද ඩොලර්





### ස්ටර්ලින් පවුම්





### යූරෝ





### ජපන් යෙන්




### ඉන්දියානු රුපියල්





### ඕස්ට්‍රේලියානු ඩොලර්




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# රාජ්‍ය මූල්‍ය අංශය

# රාජ්‍ය ආදායම සහ ප්‍රදාන





*සටහන: 2010 වසරේ සිට 2019 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. 2020-2024 දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේදී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වී ඇත.*

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් ව ඇත


මූලාශ්‍රය : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# රාජ්‍ය වියදම

## වර්තන වියදම




## ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්





(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදු කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දැ.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් ව ඇත.

සටහන: *2010 වසරේ සිට 2019 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද දැ.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. 2020-2024 දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේදී නිකුත් කරන ලද දැ.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වී ඇත.*

මූලාශ්‍රය : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# රාජ්‍ය ආයෝජන





සටහන: *2010 වසරේ සිට 2019 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. 2020-2024 දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේදී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වී ඇති අතර 2023 වසරට අදාළ දත්ත ඒ අනුව සංශෝධනය කර ඇත.*

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදු කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් ව ඇත

මූලාශ්‍රය : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# අයවැය හිඟය





සටහන: *2010 වසරේ සිට 2019 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. 2020-2024 දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේදී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වී ඇති අතර 2023 වසරට අදාළ දත්ත ඒ අනුව සංශෝධනය කර ඇත.*

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදු කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් ව ඇත.

මූලාශ්‍රය : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# මධ්‍යම රජයේ ණය




සටහන: 1. *මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (මුදල් අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන මගින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය, ණය සංඛ්‍යාලේඛන සඳහා නිල මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. දත්ත අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබෙන දත්ත මත පදනම්ව, 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව මෙම ණය දත්ත සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇත.*

2. *2010 වසරේ සිට 2019 දක්වා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 මාර්තු 15 වන දින නව පදනම් වර්ෂය (2015) යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු උපයෝගී කොටගෙන ඇත. 2020-2024 දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේදී නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වී ඇති අතර 2023 වසරට අදාළ දත්ත ඒ අනුව සංශෝධනය කර ඇත.*

(අ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශීය ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොපියවූ ණය ඇස්තමේන්තුවට ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශීය ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ. තවද, 2022 අප්‍රේල් සිට 2022 වසර අවසානය දක්වා කල් ඉකුත්වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව ගෙවීමට නියමිත සමහර කූපන්පත්වලට අදාළ ගෙවීම් 2022 දෙසැම්බර් අග ශේෂය තුළ ඇතුළත් නොවේ.


(ආ) තාවකාලික

(ඇ) කාර්තුව අවසානයට වන විට පැවති මධ්‍යම රජයේ නොපියවූ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස ගණනය කිරීමට අදාළ කාර්තුවේ සහ ඊට පෙර කාර්තු තුන මත පදනම් වූ වාර්ෂික ද. දේ.නි. ඇස්තමේන්තුව භාවිතා කර ඇත.

මූලාශ්‍ර : මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

# මුදල් අංශය

# ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, නිත්‍ය පහසුකම් අනුපාතික සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය




සටහන:


(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, නව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වේ.

(ආ) නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෙර තීරණය කරන ලද ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කර ඇත. කෙසේ වෙතත්, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමෙන් පසු නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික සහ ඵලදා වක්‍රය

## භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)*





*ලංසු පිළිගත නොහැකි වීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා ඵලදා අනුපාතික වාර්තා නොවේ.

## ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# වෙළඳපොළ පොලී අනුපාතික




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතික




සටහන: බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය මගින් බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයට ලබා දී ඇති සියලුම රුපියල් ණය සඳහා අදාළ පොලී අනුපාතික පිළිබිඹු කරන අතර, බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය මගින් යම් කිසි මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන නව රුපියල් ණය සඳහා පොලී අනුපාතික පිළිබිඹු කරයි. මෙම පොලී අනුපාතික ද්විත්වයම ගණනය කිරීමේදී රජයේ ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම සහ බැංකුවල පවත්නා අක්‍රීය ණය බැහැර කරයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමීක්ෂණය මත පදනම්ව බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය ගණනය කරනු ලැබේ. සම්මත නිර්වචනයට අනුකූලව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශය නිර්වචනය කිරීම සඳහා මෙම සමීක්ෂණය රුපියල් බිලියන 1 නොඉක්මවන වාර්ෂික පිරිවැටුම් නිර්ණායකයක් භාවිතා කරයි..

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව





මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# සංචිත මුදල් වර්ධනය, මුදල් ගුණකය සහ මුදල් සංසරණ ප්‍රවේගය

## සංචිත මුදල් වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)





## මුදල් ගුණකය සහ මුදල් සංසරණ ප්‍රවේගය (පුළුල් මුදල් සැපයුම $M_{2b}$ ට සාපේක්ෂව)




සටහන: විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු සහ වාර්ෂික සාමාන්‍ය පුළුල් මුදල් සැපයුම $M_{2b}$ මත පදනම්ව මුදල් සංසරණ ප්‍රවේගය ගණනය කෙරේ.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)




සටහන: විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# පෞද්ගලික අංශයට ලබා දුන් ණය




සටහන: විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) [ද.දේ.නි.යේ % ලෙස]





සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වන අතර 2025 ජූනි 16වන දින ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව යාවත්කාලීන කර ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ දේශීය ණය [ද.දේ.නි.යේ % ලෙස]








සටහන: මෙම දත්ත, ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පදනම් වර්ෂය 2015 දළ දේශීය නිෂ්පාදිත (ද.දේ.නි.) ඇස්තමේන්තු මත පදනම් වන අතර 2025 ජූනි 16වන දින ප්‍රකාශයට පත් කරන ලද නවතම ද.දේ.නි. ඇස්තමේන්තු අනුව යාවත්කාලීන කර ඇත.


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# ප්‍රධාන අංශ අනුව පෞද්ගලික අංශයට ලබා දුන් ණය

## ප්‍රධාන අංශ අනුව පෞද්ගලික අංශයට ලබා දුන් ණය වර්ධනය





## ප්‍රධාන අංශ අනුව පෞද්ගලික අංශයට ලබා දුන් ණය
## 2025 - පළමු කාර්තුව




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# රජයට ලබා දුන් ශුද්ධ ණය*




*රජය සතු තෝරාගත් වාණිජ ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.


සටහන: *විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

*2024 නොවැම්බර් මාසය තුළදී මහ බැංකුව විසින් රජයට ලබාදුන් ශුද්ධ ණයවල සැලකිය යුතු වර්ධනයට මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර තොගයේ වෙළඳපොළ වටිනාකම ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය වෙනස් වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

*බැංකු අංශය සතු රජයේ සුරැකුම්පත්වල වෙළඳපොළ වටිනාකම රජයට ලබාදුන් ශුද්ධ ණය මගින් පිළිබිඹු වන අතර, වෙළෙඳපොළ පොලී අනුපාත සහ මිලකරණයේ වෙනස්වීම් සඳහා ගිණුම්ගත කිරීම සඳහා වෙළෙඳපොළ පදනම මත සකස් කර ඇති අතර, එමගින් එම අංශයේ රජයට ශුද්ධ නිරාවරණය පිළිබඳ වඩාත් නිවැරදි නිරූපණයක් වේ

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය*





*රජය සතු තෝරාගත් වාණිජ ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

සටහන: විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස  වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# ශුද්ධ විදේශීය වත්කම්






සටහන: විනිමය අනුපාතිකයේ වෙනස්වීම් හේතුවෙන් ඇතිවන බලපෑම 2022 මාර්තු මාසයේ සිට ආරම්භ වන කාල සීමාව තුළ මුදල් හා ණය සමස්ත සැලකිය යුතු ලෙස වෙනස්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# මූල්‍ය අංශය

# බැංකු අංශයේ දර්ශක (i)








(අ) සංශෝධිත
(ආ) තාවකාලික
සටහන : ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) මත පදනම්ව දත්ත වාර්තා කර ඇත.


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# බැංකු අංශයේ දර්ශක (ii)

## ලාභදායිත්ව දර්ශක




## ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත





(අ) සංශෝධිත
(ආ) තාවකාලික
සටහන : ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) මත පදනම්ව දත්ත වාර්තා කර ඇත.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

# පළාත් අනුව බැංකු ඝනත්වය*


## (පුද්ගලයින් 100,000කට ශාඛා ගණන)





*ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ඇස්තමේන්තුගත මධ්‍ය වාර්ෂික ජනගහනය පදනම් කරගනිමින් පළාත් වශයෙන් බැංකු ඝනත්වය ගණනය කරනු ලබයි.

# බැංකු නොවන මූල්‍ය අංශයේ දර්ශක (i)

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් අංශයේ වත්කම්




## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් අංශයේ සමස්ත තැන්පතු සහ ණය ගැනීම්*





*තැන්පතු රැස්කිරීම සිදු කරන්නේ බලපත්‍රලාභී මුදල් සමාගම් පමණි

(අ) සංශෝධිත

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# බැංකු නොවන මූල්‍ය අංශයේ දර්ශක (ii)

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් අංශයේ ලාභදායිත්ව දර්ශක




සටහන: සෑම වසරකම අප්‍රේල් 1 වන දිනෙන් ඇරඹෙන කාලපරිච්ඡේදයේ මූල්‍ය තොරතුරු ඇසුරින් මාස 12ක් සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු පදනම් කරගනිමින් ඉහත අනුපාත ගණනය කරනු ලබයි.

## අක්‍රීය ණය අත්තිකාරම්





සටහන: ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ට අනුකූල වන පරිදි සහ නව අධීක්ෂණ අවශ්‍යතා පිළිබිඹු වන පරිදි අක්‍රීය ණය ප්‍රමාණය සහ අක්‍රීය ණය අනුපාතවලට අදාළ නිර්වචන 2022 සහ 2023 දී සංශෝධනය කරන ලදී.

(අ) සංශෝධිත

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


# කොටස් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය

## කොටස් වෙළඳපොළ දර්ශක සහ කොළඹ කොටස් හුවමාරුවේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (අ)




*(අ) කොවිඩ් -19 වසංගත ව්‍යාප්තියත් සමග රට තුළ පැවති තත්ත්වයන් හේතුකොට ගනිමින් 2020 වසරේ මාර්තු 23 සිට 2020 වසරේ මැයි 6 දක්වා කාලය තුළ කොළඹ කොටස් හුවමාරුව ක්‍රියාත්මක නොවීය.*

## ද්විතීයික වෙළඳපොළ ශුද්ධ විදේශ ප්‍රාග්ධන ලැබීම්




මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

මෙම ප්‍රස්තාර මගින් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රවණතාවල සාරාංශයක් ඉදිරිපත් කෙරේ. මෙම ප්‍රස්තාරවලට අදාළ මූලාශ්‍ර සංඛ්‍යාන දත්ත ඉදිරිපත් කර නොමැත. විස්තරාත්මක සංඛ්‍යාන දත්ත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් ලබාගත හැකි අතර අවසන් කාර්තුව සඳහා වූ දත්ත තාවකාලික දත්ත වේ.